**නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - 2024**

---

නැගී එන කලාපවල ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය අතර 2017 ජුලි 07 දින එළඹි අංක එස්එල්-පි 116 එස්ආර්අයි(එස් එෆ්) දරන ණය ගිවිසුමේ III ව්‍යවස්ථාවේ 4 වන වගන්තියේ 6(ආ) ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ අතුලත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරිම,අරමුණු, අරමුදල් ,යෙදවිම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව , රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවිමේ නියෝජිතායතනය වන අතර පළාත් 04 ක පළාත් සභා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, මූලික යටිතල පහසුකම් වැඩිදියුණු කිරිම මගින් මිනිසුන්ගේ ජීවන තත්ත්වයන් ඉහළනැංවිම සහ ජීවනෝපාය සංවර්ධනය කිරිම වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 20,622 කට සමාන ජපන් යෙන් මිලියන 15,409 ක් වන අතර ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු. මිලියන 17,185 කට සමාන ජපන් යෙන් මිලියන 12,957 ක් මූලයනය කිරීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 3,474 කට සමාන ජපන් යෙන් මිලියන 2,452 ක් මූල්‍යනය කිරීමට ශ්‍රී ලංකා රජය එකඟ වි තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2017 ජූලි 07 දින ආරම්භ කර තිබුණු අතර 2024 ජූලි 07 දින වන විට නිමකිරිමට සැලසුම්කර තිබුණි. කෙසේනමුත්, ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණ කරන දිනය 2028 අගෝස්තු 22 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 තත්ත්වාගණන මතය

මාගේ වාර්තාවේ 2.1 කොටසේ විස්තර වන කරුණු වලින් වන බලපැම හැර, ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය, වියදම් ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ බවක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.1 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරිම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන මත අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | මුදල රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය 21 හි 39(අ) ඡේදයට අනුව, ව්‍යාපෘතියේ විදේශ ණයට අදාළව රු. 178,086,652 ක සමානාත්මතා ගැලපුම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි. | 178,086,652 | ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන භාණ්ඩාගාර උපදෙස් වලට අනුකූලව සකස් කර තිබේ. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය අනුගමනය කළ යුතුය. |

**3 . මූල්‍ය සහ භෞතික කාර්යසාධනය**

**3.1 මූල්‍ය කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | **විදේශ අරමුදල් භාවිතය**<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසටහනට අනුව, 2024 අප්‍රේල් 30 වන දින ව්‍යාපෘති කාලය අවසන් වන විට, ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ජපන් යෙන් මිලියන 12,957 ට සමාන ශ්‍රී ලංකා රුපියල් මිලියන 17,185 ක් වැය කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන විට වියදම් කර තිබුණේ රුපියල් මිලියන 5,746 ක් පමණි. 2024 දෙසැම්බර් 31 වන විට විදේශ අරමුදල්වල සමුච්චිත මූල්‍ය ප්‍රගතිය සියයට 33 කි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසටහනට අනුව, ව්‍යාපෘති කාල සීමාව අවසන් වන විට ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා ජපන් යෙන් මිලියන 12,957 ක් හෙවත් ශ්‍රී ලංකා රුපියල් මිලියන 17,148 ක් වැය කිරීමට නියමිතව තිබුණි. | ව්‍යාපෘති සංශෝධිත වැඩ සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා රජයේ අරමුදල් භාවිතය**<br>ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාලසටහනට අනුව, 2024 අප්‍රේල් 30 වන දින ව්‍යාපෘති කාලසීමාව අවසන් වන විට ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා වැය කිරීමට නියමිතව තිබූ මුළු මුදල ශ්‍රී ලංකා රුපියල් මිලියන 3,474 ක් විය. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 වන විට රුපියල් මිලියන 1,311 ක් වියදම් කර තිබුණි. 2024 දෙසැම්බර් 31 වන විට රජයේ අරමුදල්වල සමුච්චිත මූල්‍ය ප්‍රගතිය සියයට 38 කි. | ව්‍යාපෘති ප්‍රගතිය ප්‍රමාද වීමට හේතුව COVID-19 වසංගතයේ සාධක වන අතර, ආර්ථික අර්බුද, ණය අත්හිටුවීම් සහ කාර්ය මණ්ඩල අඩු කිරීම් හේතුවෙන් රජයේ අරමුදල් භාවිතය අඩු වී ඇත. | ව්‍යාපෘති සංශෝධිත වැඩ සැලැස්මට අනුව ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 භෞතික කාර්යසාධනය**

**3.2.1. උප ව්‍යාපෘතිවල භෞතික කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2024 දෙසැම්බර් 31 වන විට ජල සැපයුම් උප ව්‍යාපෘති 9 ක සියයට 16-58 ක ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. | JICA ආයතනය විසින් ඔවුන්ගේ අරමුදල් අත්හිටුවීමට ඉවත් කර ඇති අතර, අර්ධ වශයෙන් නිමකර ඇති උප ව්‍යාපෘති නැවත ආරම්භ කිරීම සඳහා ව්‍යාපෘතිය මේවන විට කටයුතු කරමින් සිටියි. | සංශෝධිත වැඩ සැලැස්මට අනුව වැඩ අවසන් කළ යුතුය. |
| (ආ) | 2024 දෙසැම්බර් 31 වන විට ග්‍රාමීය මාර්ග උප ව්‍යාපෘති 30 ක සියයට 01-71 ක ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. | | |
| (ඇ) | 2024 දෙසැම්බර් 31 වන විට කෘෂිකාර්මික ජල උප ව්‍යාපෘති 12 ක සියයට 0-80 ක ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. | | |

**3.2.2 නිම නොකළ ඉදිකිරීම්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | කරෙයිනගර් නිරිතදිග මාර්ගයේ (කිලෝමීටර් 1.61) සිමෙන්ති කොන්ක්‍රීට් පදික වේදිකාවේ BOQ - B(III) 3.6 අනුව කොන්ක්‍රීට් කර තිබෙන්නේ මීටර් 1041 ක් පමණක් බැවින් මෙම මාර්ගයේ අරමුණ ඉටු වී නොමැත. ෂෝල්ඩර් ඉදිකිරීම්වල BOQ - B(III) 3.2 ට අනුව කොන්ක්‍රීට් කරන ලද මාර්ග ප්‍රදේශය බොරළු වලින් පුරවා නොතිබූ අතර එම නිරීක්ෂණය කරන ලද මාර්ගය අනාගතයේදී හානි විය හැකිය. BOQ - B(III) 5 අනුව - බෝක්කුව සහ අනෙකුත් ව්‍යුහයන්, මෙම බෝක්කුව ඉදිකර නොතිබූ බැවින් වැසි ජලය එම ප්‍රදේශයේ එකතැන පල්වෙන අතර මහජනතාව දුෂ්කරතාවන්ට මුහුණ | මෙම පැකේජයට ඇතුළත් කර තිබෙන මුළු මාර්ග සංඛ්‍යාව 03 ක් වන අතර ගිවිසුම්ගතව කොන්ත්‍රාත්තුව මේ දක්වා අත්හිටුවා ඇත. ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී. නමුත් කොන්ත්‍රාත්කරු ඉතිරි වැඩ නිම කිරීමට කැමති නැත. කොන්ත්‍රාත්තුවේ කොන්දේසිය අනුව පියවර ගත යුතුය. සංශෝධිත වැඩ සැලැස්මේ දැනුම් දෙන ලද අඩුපාඩු සලකා බලන ලදී. | ප්‍රතිලාභීන්ට පහසු වන පරිදි ඉදිකිරීම් නිම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දෙයි. BOQ - B(III) 5.5 ට අනුව - හියුම් පයිප්ප එලීම සහ ආරක්ෂක ගල් සවි කිරීම, ආරක්ෂිත ගල් 60 ක් කැටයම් කර නොමැති අතර එය අනතුරට හේතු වේ. | | |
| (ආ) | ග්‍රාමීය ජල සැපයුම් පද්ධති සඳහා UPVC D1 පයිප්ප, සවි කිරීම් සහ විශේෂ ද්‍රව්‍යයන් සැපයීමේ සහ එලීමේ ඉදිකිරීම් අවසන් කර 2023 ජනවාරි 26 දින ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට භාර දී තිබුණි. මෙම ව්‍යාපෘතියේ අරමුණ නිවාස 800 කට ජල සම්බන්ධතා සැපයීම වුවද, තාලිකුලම් සහ සොහලපුලියන්කුලම් ගම්මානවල නිවාස 207 කට පමණක් ජල සම්බන්ධතා ලබා දී තිබුණි. | මෙම ව්‍යාපෘතිය නිම කර ජාතික ජල සම්පාදන ජලාපවහන මණ්ඩලයට භාර දී තිබුණි. ව්‍යාපෘතියේ අරමුදල් ලබා ගැනීමේ හැකියාව මත පදනම්ව අතිරේක අවශ්‍යතා සලකා බලනු ලැබේ. | සැලසුම් කළ පරිදි ඉදිකිරීම් අවසන් කළ යුතුය. |

### 3.2.3 ස්ථාන චාරිකා වලදී කරන ලද නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| (අ) | මෙම ව්‍යාපෘතිය යටතේ මාර්ගයේ කිලෝමීටර 4.3 ක දිගක් සංවර්ධනය කර තිබූ අතර වැල්හින්න - කිරිගල්පොත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා රු. 117,002,435 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ නමුත් කිලෝමීටර 1.7 ක දිගකින් යුත් ABC අතුරා මූලික ඇස්ෆල්ට් මිශ්‍රණයක් පමණක් යොදවා තිබේ. එහි කොන්ක්‍රීට් ගල් ගැලවී ගොස් වලවල් නිර්මාණය වී භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණි. එපමණක් නොව, මාර්ගයේ ආරම්භයේ සිට කිලෝමීටර 2.6 දක්වා, 184.8$m^2$ (46.2x4) ක ප්‍රදේශයක් සංවර්ධනය කර නොතිබුණි. | ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීමේදී විගණනය මගින් හඳුනාගත් අඩුපාඩු නිවැරදි කරනු ලැබේ. | සැලසුම් කළ පරිදි ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මොණරාගල දිස්ත්‍රික්කයේ පාස්කිවුල ඔය මාර්ගය,5 වන කණුව, අම්පාර සංවර්ධනය කිරීම | වැඩ අවසන් කර සේවායෝජකයාට භාර දී ඇත. පාලම් ඉදිකිරීම මෙම කොන්ත්‍රාත්තුවේ විෂය පථයට | ඉදිකිරීම් අවසන් කිරීමට පියවර ගත යුතුය. |

| | |
| --- | --- |
| සඳහා අදාළ ව්‍යාපෘතිය 2020 අගෝස්තු 03 වන දින කොන්ත්‍රාත්කරුවෙකුට රු. 130,023,190 ක වටිනාකමකින් ප්‍රදානය කරන ලදී. කෙසේ වෙතත්, පාස්කිවුල ඔය හරහා පාලමක් ඉදිකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජනතාව මෙන්ම වාහන ද ගමන් කිරීමේදී ගැටළු වලට මුහුණ දී තිබුණි. | ඇතුළත් නොවේ. |